**ශීර්ෂය 277- මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**
**විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

---

**1.1** දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

---

(අ) ප්‍රාදේශීය පරිපාලනය හා සම්බන්ධීකරණය

(ආ) සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(ඇ) නියාමන කටයුතු ඉටු කිරීම.

(ඈ) ආපදා කළමනාකරණය හා සහන කටයුතු

(ඉ) සමාජ සුභ සාධන වැඩසටහන් සිදු කිරීම.

(ඊ) රාජ්‍ය ආදායම් රැස් කිරීම.

(උ) ආගමික හා සංස්කෘතික කටයුතු සිදු කිරීම.

(ඌ) මධ්‍යම රජයේ රේඛිය අමාත්‍යාංශ හා ව්‍යවස්ථාපිත අධිකාරීවල දිස්ත්‍රික් අධිකාරිත්වය දැරීම.

(එ) රාජ්‍ය සේවය ප්‍රතිනිර්මාණය කිරීම සඳහා වන වැඩසටහන් සකස් කිරීම.

(ඒ) රාජ්‍ය නොවන සංවිධාන හා පුද්ගලික අංශයේ ක්‍රියාකාරිත්වයන් අධීක්ෂණය හා සම්බන්ධීකරණය කිරීම.

**1.2** දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල

---

(අ) බිබිල

(ආ) මැදගම

(ඇ) මඩුල්ල

(ඈ) සියඹලාණ්ඩුව

(ඉ) බඩල්කුඹුර

(ඊ) මොනරාගල

(උ) බුත්තල

(ඌ) වැල්ලවාය

(එ) තණමල්විල

(ඒ) සෙවනගල

(ඔ) කතරගම

**1.3 විගණන විෂය පථය**

-----------------------

මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්,ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමණාකරණ විගණන වාර්තාව 2014 ජූනි 19 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

------------------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.5 විගණන නිරීක්ෂණය**

---------------------

2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ආ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.6 සිට 1.13 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.**

-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) බුත්තල හා මොනරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකෙහි සමාලෝචිත වර්ෂය තුළදී ගමන් වියදම් හා සංයුක්ත දීමනා වශයෙන් රු.82,775 ක් ගෙවා තිබුණු අතර, එම ගෙවීම සම්බන්ධයෙන් ඉදිරි වැඩසටහන්, සංශෝධිත වැඩසටහන් හා කළ වැඩසටහන් ඉදිරිපත් කර නොතිබුණි.

(ii) රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන දේශීය යහපාලන ව්‍යාපෘතිය යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට 2011 දෙසැම්බර් 08 දින ලැබුණු රු.943,429 කින් රු.477,429 ක් වැය කිරිම සම්බන්ධ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) විසර්ජන ගිණුම**

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) **මුළු ප්‍රතිපාදනය හා වියදම**

------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.515,849,980 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.515,127,981 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.721,999 ක් හෙවත් සියයට 0.14 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 325,300,000 | 324,578,001 | 721,999 | 0.22 |
| මූලධන | 190,549,980 | 190,549,980 | - | - |
| එකතුව | 515,849,980 | 515,127,981 | 721,999 | 0.14 |

**(ii) අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- වැය විෂයයන් 04ක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 40 ක ප්‍රමාණයක් වෙනත් වැය විෂයන්ට මාරු කර තිබුණි.
- මුදල් රෙගුලාසි 94 ට පටහැනිව වැය විෂයන් 05කට අදාළව සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා රු.5,732,402 ක බැරකම්වලට එළඹ තිබුණි.

**(iii) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශ 24 ක් හා දෙපාර්තමේන්තු 18 ක් විසින් එකතුව රු.2,271,922,739 ක් වූ ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබූ අතර, එම ප්‍රතිපාදන පිළිවෙලින් රු.1,493,501,685 ක් හා රු.631,849,034 ක් වශයෙන් එකතුව රු.2,125,350,719 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට පිළිවෙලින් රු.123,281,742 ක් හා රු.23,290,278 ක් වශයෙන් එකතුව රු.146,572,020 ක් වූ ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිය සළසා තිබුණු ප්‍රතිපාදනයන් පිළිවෙලින් සියයට 7.6 ත් සියයට 3.6 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

* දිවි නැගුම වැඩසටහන යටතේ 2011 වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 6 ක් සඳහා රු.3,182,650 ක් වැයකර පවුල් 820 ක් වෙනුවෙන් කිකිළි පැටවුන් 8,199 ක්ද, බුත්තල හා තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට කුකුල් කූඩු 113 ක් ඉදිකිරිම වෙනුවෙන් රු.428,428 ක්ද ඇතුළුව එකතුව රු.3,611,078 ක් වැයකර තිබුණි. නිසි ප්‍රමිතියට අනුව කූඩු සකස් නොකිරීම, ගුණාත්මක කුකුල් පැටවු බෙදා නොහැරීම හා අනුමත පාර්ශවයන්ට හා පරිබාහිර අයවලුන්ට කිකිළි පැටවුන් ලබාදීම වැනි කරුණු නිසා වැඩසටහනින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි වී තිබුණි. එමෙන්ම 2012 වර්ෂයේදී ගම් කුකුල් පැටවුන් 10,600 ක් ලබාදීම සඳහා රු.3,695,000 ක් වැය කර තිබුණත් ඒ වෙනුවෙන් ෆාම් කිකිළි පැටවුන් ලබා දි තිබුණි.
* මැදගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ 2013 වර්ෂයේදි දිවි නැගුම ජාතික සංවර්ධන වැඩසටහනේ 05 වන අදියර යටතේ පලතුරු පැල වර්ග 07 ක් අදාළ සැපයුම්කරුවන්ගෙන් මිලදී ගෙන ග්‍රාම නිලධාරි වසම් මට්ටමෙන් බෙදා දීමට කටයුතු කරන ලෙස දිස්ත්‍රික් ලේකම් වෙත දන්වා තිබුණද, ලබා දීමට නියමිත පැලවලින් පේර පැල 3000 ක්, දොඩම් පැල 1388 ක් හා නාරං පැල 09 ක් සැපයුම්කරුවන් විසින් සපයා නොතිබුණි.
* 2013 වර්ෂයේ දිවි නැගුම ජාතික සංවර්ධන වැඩසටහනේ V වන අදියර යටතේ සෙවනගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන්ට බෙදා හැරීම සඳහා විවිධ වර්ගයේ පැල වර්ග 14,029 ක් ලබා දී තිබූ නමුත් ප්‍රතිලාභීන්ට බෙදා හැර තිබූ පැල ප්‍රමාණය 8,834 ක් වූ අතර පැල 5,195 ක් බෙදා හැරීම පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.
* 2012 හා 2013 වර්ෂවල විමධ්‍යගත අයවැය වැඩසටහන හා පළාත් සභා ප්‍රතිපාදන යටතේ සෙවනගල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මිලදී ගෙන තිබූ විවිධ උපකරණ හා ද්‍රව්‍ය ඒකක 11,041 ක් 2014 මාර්තු 13 දින වන විටත් අදාළ සංවිධාන වලට බෙදා හැර නොතිබුණි.
* ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වැය විෂයයන් 03 ක් යටතේ නිලධාරීන් 12 දෙනෙකුට සමාලෝචිත වර්ෂයේදී රු.568,380 ක ගමන් වියදම් ගෙවා තිබුණි. 2013 ජුනි 01 දිනැති අංක HAF/01/9 දරන රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්ගේ ලිපියේ විධිවිධාන පරිදි අනුයුක්ත කර සිටින ක්ෂේත්‍ර නිලධාරීන්ගේ රාජකාරි කටයුතු විධිමත් කිරීමට අදාළ උපදෙස් අනුව කටයුතු කර නොතිබුණි.

* සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයෙන් ලද රු.39,563,098 ක ප්‍රතිපාදන උපයෝගී කර ගෙන අදියර 02ක් යටතේ මොනරාගල, බඩල්කුඹුර හා සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල සංස්කෘතික මධ්‍යස්ථාන 03 ක් ඉදිකර තිබුණි. පළමු අදියරේදී වේදිකාව සිමෙන්තිවලින් ඉදි කිරිමට රු.70,148 ක් ද, නැවත එය කඩා ඉවත් කිරීම සඳහාරු.60,145 ක් ද ගෙවා තිබුණි. මේ අනුව සැලැසුම් සහිතව කාර්ය සිදු නොකිරීම වෙනුවෙන් රු.130,293 ක ඵලදායී නොවන වියදමක් කර තිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**---------------------------------------**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

**---------------------------------------------**

විෂය අංක 27701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 34,000,000 | 29,366,599 | 23,000,000 | 31,108,928 | 147,000,000 | 100,835,002 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරික්ෂණය කරනු ලැබේ.

විෂය අංක 27701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශනය ප්‍රකාරව එදිනට අයවීම හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.3,807,843 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

**(ඈ) පොදු තැන්පත් ගිණුම**

**---------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2013 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුම් ශේෂ එකතුව රු.102,344,439 ක් විය. වර්ෂ 02 ක් ඉක්ම වූ රු.2,816,011 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් විවිධ කාර්යයන් සඳහා ලබා දී තිබුණ රු.9,049,790 ක් අදාළ කාර්යභාරය ඉටු නොකර හා ඉටු කිරීමෙන් පසු ඉතිරි මුදල් තැන්පත් ගිණුමෙහි රඳවාගෙන තිබුණි.

## 1.6 වත්කම් කළමනාකරණය

### 1.6.1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් අංක 02 දරන නිල නිවස 2013 පෙබරවාරි සිටද, සහකාර ප්‍රාදේශීය ලේකම් නිල නිවාසය 2010 සැප්තැම්බර් සිටද, ජනපද නිලධාරී නිල නිවාසය හා තල් කොළ මධ්‍යස්ථාන ගොඩනැගිල්ල 2009 ඔක්තෝබර් මාසයේ සිටද ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ඩබල් කැබ් 05 ක් , වෑන් රථ 01 ක් හා යතුරු පැදි 01 ක්ද, මැදගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් යතුරු පැදියක් වර්ෂ 08ක්ද, සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ජීප් රථයක් වසර 09ක කාලයක්ද ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ඇ) සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් රු.25,000 ක තක්සේරු වටිනාකමක් ඇති ජෙනරේටරයක් වසර 20 ක කාලයක සිට ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම.**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි වල විධිවිධානයන්ට අනුකූල නොවූ අවස්ථාවන් පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| XIX වැනි පරිච්ඡේදයේ 5.8 වගන්තිය. | 16,433 | රජයේ නිවාසවල ජල බිල්පත් පියවීම පදිංචි වී සිටින නිලධාරීන් විසින් කළ යුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් නිවාස 02 ක හිඟ විදුලි බිල්පත් පියවීම හා ජලය නැවත සන්ධි කිරීමේ ගාස්තු කාර්යාලයෙන් ගෙවා තිබුණි. |

**(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

-------------------------------

| | |
|---|---|
| (i) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛයේ ii ඡේදය | සෑම මාස 6 කට වරක් ඉන්ධන දහනය පරීක්ෂා කළ යුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාහන 07 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. |
| (ii) 2013 ජුනි 12 දිනැති අංක HAF/01/9- විවිධ දරන රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය | වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ක්ෂේත්‍ර නිලධාරීන් විසින් නියමිත දිනට ඉදිරි වැඩසටහන් ඉදිරිපත් කර නොතිබීම, ඉටු කිරිමට අපේක්ෂිත රාජකාරි නිශ්චිතව දක්වා නොතිබීම හා ක්ෂේත්‍ර නිලධාරීන් විසින් ඉටු කරනු ලැබූ රාජකාරී ගැන මාසික ලිඛිත වාර්තා තබා නොතිබුණි. |
| (ඇ) 2009 සැප්තැම්බර් 18 දිනැති අංක PF 437 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ට අයත් වාහන 04 ක් සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රක්ෂණ ආවරණයක් ලබාගෙන නොතිබුණි. |
| (ඈ) 2013 ජුලි 05 දිනැති අංක PCMD/PR/2013 දරන ජනාධිපති ලේකම්ගේ ලිපිය | ප්‍රයෝජනයට නොගෙන විනාශ වෙමින් පවතින පැරණි වාහන හා යන්ත්‍රෝපකරණ ආදිය මාස 03 ක් ඇතුළත අපහරණය කිරිමට වැඩ පිළිවෙලක් සකස් කළ යුතු වුවත් වාහන 05 ක් සම්බන්ධයෙන් එසේ අපහරණ කටයුතු අවසන් කිරිමට කටයුතු කර නොතිබුණි. |
| (ඉ) 1996 දෙසැම්බර් 06 දිනැති අංක 17/96 දරන කෘෂිකර්ම ඉඩම් හා වන සම්පත් අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 13.4 ඡේදය හා 2005 ඔක්තෝබර් 10 දිනැති අංක 01/2005 දරන සංශෝධිත චක්‍රලේඛය | මොනරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් දැව කඳන් හා ඉරූ දැව කඳන් ප්‍රවාහනය සඳහා බලපත්‍ර නිකුත් කිරීමේදී, විශේෂ හේතුවක් ඇත්නම් මිස සති අන්ත හා රජයේ නිවාඩු දිනවල දැව කඳන් හෝ ඉරූ දැව ප්‍රවාහනය සඳහා බලපත්‍ර ලබා නොදිය යුතු වුවත් ඊට පටහැනිව දැව ප්‍රවාහන බලපත්‍ර 129 ක් නිකුත් කර තිබුණි. |

## 1.8 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම හා ව්‍යාපෘති සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) ව්‍යාපෘති ආරම්භ නොකර අතහැර දැමීම

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ යුතු දිනය | ආරම්භ නොකිරිමට හේතු |
|---|---|---|---|
| | රු. | | |
| සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කොටියාගල මයිල බ්‍රහ්ම ආරණ්‍ය සෙනසුන සංවර්ධනය | 50,000 | 2013 | පුරා විද්‍යා දෙපාර්තමේන්තුව හා ස්වාමීන් වහන්සේලා අතර එකඟතාවයකට පත් නොවීම. |
| සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වේරගොඩ විසුද්ධාරාම දහම් පාසලේ ධර්ම ශාලා ගොඩනැගිල්ල ඉදිකිරීම. | 100,000 | 2013 | ස්වාමීන් වහන්සේලාගෙන් හා දායක සභාවෙන් සක්‍රීය දායකත්වයක් නොලැබීම. |
| බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ යුදගනාව ජනපදයේ අංක 57 අසල මාර්ගයේ බෝක්කුව ඉදිකිරීම. | 250,000 | 2013 | ඇස්තමේන්තුගත මුදල ව්‍යාපෘතිය නිම කිරිමට ප්‍රමාණවත් නොවීම නිසා කොන්ත්‍රාත්කරුවන් ප්‍රතික්ෂේප කිරිම. |
| බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බුරුතගොල්ල 01 ඇළ අතුරු මාර්ගය ප්‍රතිසංස්කරණය කිරිම. | 200,000 | 2013 | -එම- |

**(ආ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

**-----------------------------------------**

වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් තෙළුල්ල ජනපදයේ කෘෂි ළිඳක් ඉදිකිරීම සඳහා රු.440,064 ක ඇස්තමේන්තුවක් සකස් කර 2013 නොවැම්බර් 01 දින වැඩ ආරම්භ කර තිබුණි. ප්‍රතිලාභී පාර්ශවයන්ගෙන් ලබා ගැනීමට තිබූ ශ්‍රම දායකත්වය ලබා නොදීම නිසා ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අතහැර දමා තිබුණි.

**(ඇ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා**

**-----------------------------------------**

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කළ නියැදි පරීක්ෂණවලදි පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මඩුල්ල ප්‍රාදේශීය ලේකම් නිල නිවාසය ඉදිකිරීම සඳහා 2013 ජූනි 25 දින එක්තරා කොන්ත්‍රාත්කරුවකු වෙත එකතු කළ අගය මත බදු සහිතව රු.8,324,982 ක ගිවිසුම්ගත වටිනාකමට කොන්ත්‍රාත්තුව පවරා තිබූ අතර විගණන දිනය වන විට කොන්ත්‍රාත්කරුට රු.7,907,833 ක මුදලක් ගෙවා තිබුණි.

2013 දෙසැම්බර් 18 දින වැඩ අවසන් කර තිබූ මෙම නිල නිවාසයේ විෂය අංක J 01, J 02 සහ FG 01 යටතේ රාමු සහිත දොරවල් 9 ක් සවි කිරීම සඳහා රු.449,927 ක් ගෙවා තිබුණත් 2014 මැයි 02 දින සිදු කළ ක්ෂේත්‍ර පරික්ෂාවේදී Fit Panel දොර පළු 09 ක සවි කරන ලද ලෑලි නියමිත පරිදි හේත්තු කර සවිකර නොතිබූ හෙයින් දොර පළුවල විශාල වශයෙන් හිඩැස් නිරික්ෂණය විය. තවද නිවාසයේ පළමු මහලේ පිහිටි බැල්කනිය සඳහා පොළොව කපරාදු කර සුදු මැදීම සිදු කර නොතිබුණි.

(ii) තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරී නිල නිවස ඉදිකිරීම සඳහා එක්තරා කොන්ත්‍රාත්කරුවකු වෙත රු.7,566,015 ක් ගෙවීම් කර තිබුණි. භෞතික පරීක්ෂාවේදී,

* ජනෙල්වල බීඩිං පටි ගුල්ලන්ගෙන් විනාශ වීම.
* ග්‍රිල් සවි නොකිරිම.
* බැල්කනියේ යකඩ අත්වැලෙහි මලනොබැඳෙන තින්ත ආලේප කර නොතිබුණි.

(iii) 2012 විමධ්‍යගත අයවැය යටතේ මොනරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.515,394 ක් වැය කර ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 03 ක් පරික්ෂාවේදී පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය | වටිනාකම | නිරීක්ෂණය වූ කරුණු |
|---|---|---|
| | රු. | |
| භාණ්ඩ මිලදී ගැනීම. | 41,182 | 2013 නොවැම්බර් 20 දින වන විටත් මිලදී ගෙන තිබුණු භාණ්ඩ ප්‍රතිලාභීන්ට බෙදා හැර නොතිබුණු අතර, එම භාණ්ඩ විවිධ ස්ථානවල ගබඩා කර තිබුණි. |
| වෙල්ලස්ස ගොවි සුබසාධන සංගමයට බ්ලොක් ගල් මැෂිමක් හා ධාන්‍ය ඇඹරුම් යන්ත්‍රයක් මිලට ගැනීම. | 95,002 | * ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ 2013 මාර්තු 28 දිනැති අංක MED/RD/DCB/GEN/13 දරන ලිපියේ 06 ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදන තීරණ මත මිල ගණන් කැඳවා මිලදී ගෙන නොතිබුණි.<br>* ඇඹරුම් යන්ත්‍රය පෞද්ගලික මිරිස් මෝලක සවි කර තිබූ අතර, බ්ලොක් ගල් යන්ත්‍රයද පෞද්ගලික ස්ථානයක තිබුණි. |
| ගොවි සංවිධාන 06 කට උදලු තල 413 ක්ලබාදීම. | 359,310 | සැලැසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශ ලේකම්ගේ 2009 මාර්තු 03 දිනැති අංක MGI/DCB/3 දරන චක්‍රලේඛයේ ඇතුළත් උපලේඛනයේ 3.1.3 අනුව මිලදී ගන්නා කෘෂි උපකරණ ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා ගොවි සංවිධානවලට ලබා දී නොතිබුණි. |
| ඌව වෙල්ලස්ස ගොවි සංවිධානයට ෆැක්ස් යන්ත්‍රයක් හා රෝලක් ලබා දීම. | 19,900 | 2013 නොවැම්බර් 22 වන දින සිදු කළ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී අදාල ෆැක්ස් යන්ත්‍රය විගණනයට ඉදිරිපත් කිරීමට අපොහොසත් විය. |
| | **515,394** | |

(iv) ජාතික සවිය ගම නැගුම සංවර්ධන වැඩසටහන යටතේ කවුඩාව මහවෙල අමුණ ප්‍රතිසංස්කරණය කිරිම සඳහා 2009 හා 2011 වර්ෂවලදී මොනරාගල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත රු.2,400,000 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර ඉන් රු.2,375,231 වැය කර තිබුණි. විගණන දිනය වූ 2013 ඔක්තෝබර් 23 දින වන විටත් ඇල සම්පූර්ණයෙන් වල් බිහි වී තිබූ අතර ඇල මාර්ගය ඔස්සේ වගා බිම්වලට ජලය සපයා ගැනිමට නොහැකි වී තිබුණි. 2011 වර්ෂයේ සිදු කර තිබූ ඉදි කිරීම් පරීක්ෂාවේදී නොකළ වැඩ සඳහා රු.296,779 ක්ද, විස්තර ඉදිරිපත් නොවූ වැඩ කොටස් සඳහා රු.27,645 ක්ද ගෙවා තිබුණි.

(v) 2008 හා 2009 වර්ෂවලදී ජාතිය ගොඩනැගීමේ අමාත්‍යාංශයේ ප්‍රතිපාදනවලින් ගමේ සියලුම රාජ්‍ය ආයතන එකම පියසක් යටතට ගැනීමේ අරමුණින්

රු.3,922,914 ක් වැල්ලවාය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් වැය කර තිබුණි. ඉදිකර තිබුණු ජන සභා කාර්යාල පියස 2013 නොවැම්බර් 14 දින වන විටත් කිසිදු ප්‍රයෝජනයකට ගෙන නොතිබූ අතර, ගොඩනැගිල්ල ස්වාභාවික ආපදාවන්ට ලක්වෙමින් පැවතුණි. තවද, 2013 වර්ෂයේ විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ අළුත්වැඩියාව සඳහා රු.145,500 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර විගණන දිනය වූ 2013 නොවැම්බර් 14 දින වන විට රු.56,578 ක් එක්තරා සමෘද්ධි බලකායක් වෙත ගෙවා තිබුණි.

(vi) 2010 හා 2012 වර්ෂවලදී විමධ්‍යගත වැඩසටහන යටතේ වැල්ලවාය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මිලදී ගෙන තිබූ භාණ්ඩ හා උපකරණ 574ක් විගණන දිනය වූ 2013 නොවැම්බර් 07 දින වන විටත් බෙදා හැරීමට කටයුතු කර නොතිබුණි.

(vii) 2012 හා 2013 විමධ්‍යගත අයවැය වැඩසටහන මඟින් මැදගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මිලදී ගෙන තිබූ විවිධ උපකරණ 1265 ක් විගණන දිනය වූ 2013 නොවැම්බර් 08 දින වන විටත් බෙදා හැරීමට කටයුතු නොකර ගබඩාවේ රඳවාගෙන තිබුණි.

(viii) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ප්‍රතිපාදන මත කරමැටිය ගුරුත්ව ජල යෝජනා ක්‍රමය සඳහා ජල උපාංග හා ජලමනු ලබා ගැනීම සඳහා මැදගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.134,010 ක් 2012 දෙසැම්බර් 31 දින ගෙවා තිබුණි. 2013 නොවැම්බර් 14 දින සිදු කළ ක්ෂේත්‍ර පරික්ෂාවේදී ඒ වන විටත් වටිනාකම රු.22,950 ක් වූ ජල මනු 17 ක් හා රු.4,255ක් වටිනා ජල උපාංග 23 ක් අදාළ කාර්යය සඳහා යොදාගෙන නොතිබුණි.

(ix) 2003 හා 2004 වර්ෂවලදී ආසියානු සංවර්ධන බැංකු මූල්‍ය ප්‍රතිපාදන යටතේ ඉදිකර තිබුණු කොටබෝව ජල යෝජනා ක්‍රමයේ ජල මෝටරය ළිඳ තුළට වැටීම නිසා 2008 වර්ෂයෙන් පසුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී නොතිබුණි. 2010 හා 2011 වර්ෂවලදී අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් රු.531,552 ක වියදමක් කර තිබුණද, 2013 නොවැම්බර් 08 දින වන විටත් එය ක්‍රියාත්මක නොකිරීම නිසා අධික නියං කාලවලදී මැදගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂය තුළ ජලය බෙදා හැරීමට රු.202,926 ක වියදමක් කර තිබුණි.

(x) 2012 විමධ්‍යගත හා උපමාන පාදක වැඩසටහන යටතේ ක්‍රීඩා සමාජවලට ලබා දීමට විධිමත් ඇගයීමකින් තොරව රු.148,210 ක් වැය කර සෙවනගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රීඩා උපකරණ මිලදී ගෙන තිබුණි. එම ක්‍රීඩා භාණ්ඩ අදාළ සංවිධානවලට ලබා දී නොතිබුණු අතර මිලදී ගෙන තිබුණු සැහැල්ලු ක්‍රිකට් පිති පළුදු වී තිබුණි.

(xi) දේශීය යහපාලන ව්‍යාපෘතිය යටතේ ස්ථම්භ 03 හා ස්ථම්භ 05 යටතේ සිදු කරන ලද පුහුණු වැඩසටහන් වල මුද්‍රණ කටයුතු හා අනිකුත් කාර්යයන් සඳහා 2011 දෙසැම්බර් 08 දින රු.943,429 ක් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් එවා තිබුණි. එම මුදලින් රු.466,000 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබූ අතර ඉන් රු.219,524 ක් විධිමත් අනුමැතියකින් තොරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක ජාලගත කිරීම් සඳහා 2013 දෙසැම්බර් 28 වන දින ශ්‍රී ලංකා ටෙලිකොම් වෙත ගෙවා තිබුණි. ඉතිරි මුදල වසර 02 කට අධික කාලයක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන 2013 දෙසැම්බර් 31 දින ආපසු ව්‍යාපෘතියට යවා තිබුණි.

## 1.9 වැඩිපුර ගෙවීම්

---------------

ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 12 උප වගන්තියට පටහැනිව, ප්‍රාදේශීය ලේකම්වරු තිදෙනෙකු සහ පරිපාලන නිලධාරීන් තිදෙනෙකු වෙත වැඩිපුර ගෙවා තිබුණු රු.335,759 ක් වූ වැඩ බැලීමේ/ රාජකාරී ඉටු කිරීමේ දීමනා 2014 ජූනි 10 දින වන විටත් ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 1.10 අවිධිමත් ගනුදෙනු

--------------------

නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවිධිමත් ස්වභාවයේ ගනුදෙනු පහත දැක්වේ.

**(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැර වීම.**

---------------------------------------------------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.1 හා 2.14.1 මාර්ගෝපදේශ ප්‍රකාරව ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවට වෙළඳ පොල මිල සැඳහුම් ක්‍රමය යටතේ මිලදී ගත හැකි උපරිම සීමාව රු.500,000 ක් වුවද, මැදගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අංක 04 හා 2013 ජූනි 26 දිනැති ප්‍රසම්පාදන තීරණය මත රු.993,735 ක් වටිනා දහම් පාසල් උපකරණ මිලදී ගෙන තිබුණි.

**(ආ) අධිකාරි බලය නොලත් ගනුදෙනු**

---------------------------------

නියැදි පරීක්ෂණවලදි අනාවරණය වූ අධිකාරි බලය නොළත් ගනුදෙනු පහත දැක්වේ.

(i) මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රතිපාදන මත විද්‍යාතා හා තාක්ෂණ නිලධාරීයකු වෙත පරිගණක වැඩ සටහන්කරණය පිළිබඳ පුහුණුවක් ලබා දීමට පෞද්ගලික ආයතනයක් වෙත රු.24,625 ක් ගෙවා තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රතිපාදන මත වෙනත් අමාත්‍යාංශයක නිලධාරීන් පුහුණු කිරීම කර තිබුණි.

(ii) දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතියකින් හා කුලී අය කිරීමකින් තොරව පුහුණු මධ්‍යස්ථානයක් හා සම්බන්ධීකරණ කාර්යාලයක් වශයෙන් පවත්වාගෙන යන මොණරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පරිපාලන නිලධාරීගේ නිල නිවස 2012 අයවැය වැඩසටහන යටතේ රු.200,000 ක ප්‍රතිපාදන වලින් රු.180,000 ක් වැයකර අළුත්වැඩියා කර තිබුණි.

(iii) 2013 මාර්තු 06 දින මොනරාගල පුස්තකාල ශ්‍රවණාගාරයේ පැවති ජාතික කාන්තා දින සැමරුම් උත්සවයේ සමෘද්ධි ප්‍රතිලාභී කාන්තාවන් සඳහා උදෑසන ආහාර සැපයීම වෙනුවෙන් වැය කළ මුදල් පියවා ගැනිම සඳහා රු.310,000 ක මොනරාගල දිස්ත්‍රික්කයේ සමෘද්ධි බලකා / සමාජ සංවර්ධන පදනම් හා ගම්මාන සමිතිවලින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා එකතු කර මොනරාගල දිස්ත්‍රික් සහකාර සමෘද්ධි කාර්යාලය වෙත ලබා දී තිබුණි. මේ පිළිබඳ පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

* මොනරාගල දිස්ත්‍රික්කයේ සමෘද්ධි බලකා / සමෘද්ධි ගම්මාන සමිතිවලින් මුදල් ලබා ගැනිම සඳහා ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ අංක 2009/05 දරන චක්‍රලේඛය හා අභ්‍යන්තර මහ පෙන්වීම් චක්‍රලේඛ අංක බැ.මු.අ. 2013/05 ප්‍රකාරව ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියෙන් අනුමැතියක් ලබා ගෙන නොතිබුණි.
* මුදල් රෙගුලාසී 168 (1) ප්‍රකාරව ලබා ගත් මුදල් සඳහා කුවිතාන්සි නිකුත් කර රජයේ ගිණුමක තැන්පත් කර නොතිබුණි.
* සහභාගී වූ ප්‍රතිලාභීන්ගේ ලේඛනයක් නොමැතිව හා දිස්ත්‍රික් ලේකම්වරයා අනුමත නොකර දිස්ත්‍රික් සමෘද්ධි බලකායෙන් සහ සමෘද්ධි ගම්මාන සමිති වලින් රු.310,000 ක් සැපයුම්කරුවන් තිදෙනෙකුට චෙක්පත් භාවිතා නොකර මුදලින් ගෙවා තිබුණි.

**1.11** පාඩු

----

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

**(අ)** වසර ගණනාවක සිට විසර්ජන ගිණුමෙහි ඩීජීඑස් ඒ 7 ආකෘතියෙහි දක්වා තිබුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 කට අදාළ එකතුව රු.4,018,203 ක් වූ වාහන අනතුරු 18 ක් සම්බන්ධයෙන් 2013 දෙසැම්බර් 31 දින වන විටත් මුදල් රෙගුලාසී ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ආ)** සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02ට අදාළව සිදු වූ අනතුරු 04ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) ප්‍රයෝජනයට නොගෙන විනාශ වෙමින් පවතින පැරණි වාහන 04 ක් වසර 02 ක සිට වසර 04 දක්වා කාල පරාසයක සිට දිස්ත්‍රික් ක්‍රමසම්පාදන කාර්යාල භූමියේ ගාල් කර තිබුණි. එම වාහනවලින් වාහන 03 ක් සුළු වශයෙන් හානි වී තිබුණි. වාහන පණගැන්විය

නොහැකි බවත් 2013 සැප්තැම්බර් 10 දිනැති මෝටර් රථ පරීක්ෂකගේ වාර්තාවේ සඳහන් කර තිබුණි. 2013 ජූනි 05 දිනැති අංක PCMD/PR/2013 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛයේ විධි විධාන ප්‍රකාරව මෙම වාහන අපහරණය කිරිමට කටයුතු කර නොතිබුණි.

(ඈ) කැබ් රථයක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 29 දින තෙළුල්ල ජනපදයේදී අනතුරට පත්ව තිබුණි. විගණන දිනය වූ 2014 අප්‍රේල් 24 දින වන විටත් මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාර පරීක්ෂණ සිදු කිරිමට කටයුතු කර නොතිබුණි. අනතුරට පත් රථයේ රියදුරුට විගණන දිනය වූ 2014 අප්‍රේල් 24 දින දක්වාම රියදුරු රාජකාරියක් ඉටු කරවා නොගෙන එම කාලය සඳහා වැටුප් වශයෙන් රු.100,878 ක් ගෙවා තිබුණි.

## 1.12 කළමනාකරණ දුර්වලතා

--------------------------

පහත සඳහන් කළමනාකරණ දුර්වලතා නිරික්ෂණය විය.

**(අ)** 2013 අප්‍රේල් 23 දින පැවැති පසුගිය රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී 2005, 2006, 2007, 2008, 2009 හා 2010 වර්ෂ වලට අදාළ විගණකාධිපති වාර්තාව සාකච්ඡාවට භාජනය විය. එහිදි ගන්නා ලද කමිටු තීරණයන් හා නිර්දේශ ක්‍රියාත්මක කිරිමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

**(ආ)** බුත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ජය භූමි දීමනා පත්‍ර ඉඩම්වල දැව හෙළීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේදී 2011 නොවැම්බර් 16 දිනැති ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංක 2011/06 දරන චක්‍රලේඛයේ විධිවිධාන අනුගමනය නොකොට ජනපද නිලධාරී හා ග්‍රාම නිලධාරී නිර්දේශ මත ජය භූමි දීමනා පත්‍ර ඉඩම්වල දැව හෙළීම සඳහා බලපත්‍ර නිකුත් කර තිබුණි.

**(ඇ)** ඉඩම් කාර්ය සංග්‍රහයේ 227 වන වගන්තිය ප්‍රකාරව 1946 අංක 08 දරන රාජසන්තක ඉඩම් ආඥා පනතේ 58 වන වගන්තිය යටතේ ගැසට් නිවේදනයක් පල නොකර පොදු ජල මාර්ග දෙපස ඇති නියමිත ප්‍රමාණයේ බිම් තීරුවක් රක්ෂිතයක් ලෙස නීත්‍යානුකූලව පිළිගැනෙන බව දක්වා තිබුණි. ඒ සම්බන්ධව අවධානය යොමු නොකර මිනින්දෝරු වාර්තා ලබා ගැනීමට පෙර කුඹුක් ගස් 05 ක් සඳහා බලපත්‍ර නිකුත් කර තිබුණු අතර, එයින් ගස් 03 ක් රජයේ ඉඩමකට අයත් ගස් බව මිනින්දෝරු වාර්තා වලින් ද පසුව හෙළිදරව් විය.

**(ඈ)** කතරගම ඇසල උත්සවයේ විදුලිය සඳහා භාණ්ඩාගාරයෙන් නිශ්චිත ප්‍රතිපාදන වෙන් කර නොගෙන 2009 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වැය ශීර්ෂ කිහිපයක් යටතේ වියදම් දරා තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට ඒ වෙනුවෙන් විදුලිබල මණ්ඩලයට රු.5,517,471ක් ගෙවීමට සිදුව තිබුණි.

**(ඉ)** කතරගම ඇසල උත්සවයේ පූජා නගරය හා ඒ අවට ආලෝකමත් කිරීම සඳහා අතිරේක විදුලිය සැපයීම වෙනුවෙන් 2009 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා රු.26,580,120 ක මුදලක් ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවා තිබුණද ඒ සඳහා විස්තරාත්මක ඇස්තමේන්තුවක් සහ අතිරේක විදුලි පහසුකම් සපයන ස්ථාන සම්බන්ධයෙන් දළ සැලැස්මක් ලබාගෙන නොතිබුණි.

**(ඊ)** දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතුව නිල වාහන 02 ක් හා සංචිත වාහන 06 ක්ද, ඊට අමතරව බස් රථයක් හා ලොරි රථයක් ද ධාවන කටයුතු සඳහා යොදාගෙන තිබුණි. අනුමත හා සිටින කාර්ය මණ්ඩලය අනුව බඳවාගත් රියදුරු තනතුරු සංඛ්‍යාව 05 ක් විය. මුදල් රෙගුලාසි 71 ප්‍රකාරව පවතින වාහන ප්‍රමාණයට අනුව රියදුරු තනතුරු අනුමත කරවාගෙන රියදුරන් වාහන සඳහා යෙදවීමට කටයුතු කර නොතිබුණි.

(උ) සමෘද්ධි ජීවනෝපාය වක්‍රීය ණය සංවර්ධන වැඩසටහන යටතේ 2007 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා සමෘද්ධි බැංකු මඟින් ලබා දී තිබූ ණයවලින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 කට අදාළ රු.16,967,952 ක මුදලක් 2013 දෙසැම්බර් 31 දින වන විට අයවීම අත්හිටුවා තිබුණි.

**(ඌ)** රජයේ නිවාස පිහිටි ඉඩම් නිරවුල් කරවාගෙන මිනුම් ගැනීමෙන් අනතුරුව අදාල පිඹුරුපත් සාදවා ගෙන ඉඩම් වල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණ අතර සමහර නිවාසවලට අයත් ඉඩම්වල විශාල වශයෙන් අනවසර ඉදිකිරීම් සිදු කෙරෙමින් පවතින බව නිරීක්ෂණය විය.

**(එ)** මොනරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ග්‍රාම නිලධාරී වසම් 03 ක පතස් 10 බැගින් 30 ක් ඉදි කිරීම සඳහා 2011 අගෝස්තු 01 දින රු.190,000 ක් ලැබී තිබුණි. විගණන දිනය වූ 2013 නොවැම්බර් 22 දින වන විටත් අදාළ කාර්ය ඉටු නොකර එම මුදල් තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

**(ඒ)** දිස්ත්‍රික් ක්‍රම සම්පාදන ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාස 12 ක් සම්බන්ධයෙන් කළ පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| **නිවාස වර්ගය** | **පදිංචි අයගේ තනතුර** | **පදිංචි වූ කාලය** | **නිරීක්ෂණය** |
|---|---|---|---|
| -------- | ------------- | --------- | -------------- |
| | | **වර්ෂ** | |
| උපලේඛනගත | සංවර්ධන නිලධාරි | 06 | සහකාර සැලසුම් අධ්‍යක්ෂකවරු 04 දෙනෙකු ඉල්ලුම් කර තිබුණත්, සංවර්ධන නිලධාරී පදිංචි වී සිටීම. |
| උපලේඛනගත | ජාතික ශිෂ්‍ය භට බලකාය | 03 | 2011 මාර්තු 22 දින සිට ජාතික ශිෂ්‍ය භට බලකායට වසර 2ක කාලයක් සඳහා භාර දී තිබුණද, අදාල පාර්ශවයන් සමඟ ගිවිසුම් |

| | | | |
|---|---|---|---|
| | | | අත්සන් කර නොතිබූ අතර, මාසික ආර්ථික කුලිය රු.2,850 බැගින් 2013 අප්‍රේල් 21 දින වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| උපලේඛනගත නොවන | කළමනාකරණ සහකාර/සංවර්ධන සහකාර, කාර්යාල කාර්ය සහායක | 05 සිට 24 දක්වා | ඉල්ලුම් කළ නිලධාරීන් 06 දෙනෙකුට නිවාස ලබා නොදී දීර්ඝ කාලයක් එකම නිලධාරීයෙකු පදිංචි වී සිටීම. |
| උපලේඛනගත | කළමනාකරණ සහකාර නිලධාරි | 23 | විශ්‍රාම ගිය නිලධාරියා විසින් විධිමත් පරිදි නිවාසය භාර නොදීම හා රු.3,400 ක නිවාස කුලී අයකර ගෙන නොතිබුණි. |

**1.13 මානව සම්පත් කළමනාකරණය**

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු**

2013 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි වේ.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 41 | 34 | 7 |
| (ii) | තෘතියික මට්ටම | 22 | 06 | 16 |
| (iii) | ද්විතියික මට්ටම | 707 | 541 | 166 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 110 | 98 | 12 |
| (v) | වෙනත් (අනියම්) | - | 04 | - |
| | එකතුව | **880** | **683** | **201** |

**(ආ)** වෙනත් අමාත්‍යාංශ යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල 2013 දෙසැම්බර් 31 වන දිනට අනුමත සේවක සංඛ්‍යාවට අමතරව ජ්‍යෙෂ්ඨ

මට්ටමේ සේවකයින් 11 ක්ද, ද්විතියික මට්ටමේ සේවකයින් 744ක්ද, යොදවාගෙන තිබුණි.

**(ඇ)** මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව හා 1993 ඔක්තෝබර් 07 දිනැති ස්වදේශ කටයුතු හා පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම්ගේ අංකඊ/2/ඇප ලිපිය ප්‍රකාරව භාණ්ඩ හා මුදල් භාරව කටයුතු කරන නිලධාරීන් හා චෙක්පත් අත්සන් කරන නිලධාරීන් ඇප තැබිය යුතු වුවත්, සෙවනගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් 03 දෙනෙකුගෙන් අදාල පරිදි රු.30,000 ක ආරක්ෂණ ඇප මුදල් ලබාගෙන නොතිබුණි.

**(ඈ)** මුදල් රෙගුලාසි 880 හා 1991 සැප්තැම්බර් 09 දිනැති අංකඊ/2/30 (i) දරන රාජ්‍ය පරිපාලන, පළාත් සභා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය ප්‍රකාරව සෙවනගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාම නිලධාරීන් 03 දෙනෙකුගෙන් රු.3,000 ක ඇප තැන්පතු ලබාගෙන නොතිබුණි.

**(ඉ)** කොන්ත්‍රාත් පදනම යටතේ මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රාජකාරී පවරා ඇති සේවකයකුට 2010 අප්‍රේල් සිට 2014 මැයි දක්වා පාර්ලිමේන්තු කටයුතු ඇමතිනියගේ කාර්ය මණ්ඩලයේ කළමනාකාර සහකාර වශයෙන්ද, මොනරාගල ආපදා කළමනාකරණ ඒකකයේ ආපදා කළමනාකරණ තනතුරේද කටයුතු කිරීමට පත් වීමක් ලබා දී තිබුණු අතර, මෙම පුද්ගලයා විසින් පත්වීම් දෙකම දරමින් එකී ධූර කාලය තුළදී වැටුප් හා දීමනා වශයෙන් රු.1,913,757 ක මුදලක් ලබා ගෙන තිබූ අතර, මීට අමතරව මොහු වෙනුවෙන් රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදලේ දායකය වශයෙන් රු.184,254 ක් එම අරමුදලට බැර කර තිබුණි.